# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 38 දරන
# මහවැලි සංවර්ධන මණ්ඩල
# (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 35 යි		තැපැල් ගාස්තුව ශත 50 යි

# 1983 අංක 38 දරන මහවැලි සංවර්ධන මණ්ඩල (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 06 වන දින.]

එල්. ඩී.—ඕ. 12/83

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයේ යෙදී සිටින මහවැලි සංවර්ධන මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ රැකියාව දිගටම පවත්වාගෙන යාම සඳහා ද ; මහවැලි සංවර්ධන මණ්ඩලයේ සියලු වත්කම්, බැරකම්, දේපළ අයිතිවාසිකම් සහ බැඳීම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පැවරීම සඳහා ද ; 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 38 දරන මහවැලි සංවර්ධන මණ්ඩල (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

2. (අ) (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහවැලි සංවර්ධන මණ්ඩලයේ නියමිත දිනයට ඉහතින්ම වන දිනයේ සේවයෙහි නියුක්තව සිටින සියලු නිලධරයන් සහ සේවා නියුක්තයන් නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි, මණ්ඩලය යටතේ ඔවුන් සේවා නියුක්තවීමට අදාළ නියම හා කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම හා කොන්දේසිවලට යටත්ව, (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයේ යෙදී සිටින සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) මණ්ඩලය විසින් හෝ එය සමඟ හෝ එය වෙනුවෙන් ඇති කර ගනු ලැබූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් අධිකාරියේ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු අතර නියමිත දිනයට ඉහතින්ම වන දිනයෙහි පවතින මණ්ඩලයේ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම් අධිකාරියේ අයිතිවාසිකම්, වරප්‍රසාද, බැඳීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) (මණ්ඩලයේ අරමුදලේ ඇති මුදල් සහ යම් බැංකුවක හෝ වෙනත් ආයතනයක මණ්ඩලයේ බැරට ඇති මුදල් ද ඇතුළු) මණ්ඩලයේ සියලු චංචල දේපළ සහ මණ්ඩලය වෙත පවරනු ලැබ ඇති හෝ මණ්ඩලය විසින් මිලයට ගනු ලැබ ඇති හෝ අත්කර ගනු ලැබ ඇති හෝ මණ්ඩලය වෙත බදු දෙනු ලැබූ හෝ මණ්ඩලය විසින් බැහැර කරනු ලැබීම සඳහා භාර දෙන ලද හෝ යම් ආකාරයකින් මණ්ඩලය වෙත පවරන ලද හෝ මණ්ඩලය විසින් සන්තකය දරන හෝ පාලනය කරන හෝ යම් නිශ්චල දේපළක් නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි ඒ දේපළ සම්බන්ධයෙන් පවත්නා නියම හා කොන්දේසිවලට යටත්ව, අධිකාරියේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

*මණ්ඩලයේ සේවා නියුක්තයන්, කොන්ත්‍රාත්තු, අයිතිවාසිකම්, බැඳීම්, බැරකම්, දේපළ සහ මණ්ඩලය විසින් හෝ එයට විරුද්ධව පවරා ඇති නඩු සහ මණ්ඩලයට පක්ෂව හෝ එයට විරුද්ධව දී ඇති තීන්දු, ප්‍රකාශ සහ ප්‍රදාන, අධිකාරියේ සේවා නියුක්තයන්, කොන්ත්‍රාත්තු යනාදිය ලෙස සැලකිය යුතු බව.*

(ඇ) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව පවරන ලද නැතහොත් මණ්ඩලය පාර්ශ්වයක් වන්නා වූ ද, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි විභාග වෙමින් පවතින යම් නඩුවක්, කාරණයක්, නඩු කටයුත්තක් හෝ දෙයක් නියමිත දින සිට බලපවත්නා පරිදි, අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව නැතහොත් අධිකාරිය පාර්ශ්වයක් වන නඩුවක්, කාරණයක්, නඩු කටයුත්තක් හෝ දෙයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඉ) යම් නඩුවක දී, කාරණයක දී, නඩු කටයුත්තක දී හෝ දෙයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින් මණ්ඩලයට පක්ෂව හෝ එයට විරුද්ධව දෙන ලද යම් තීන්දු ප්‍රකාශයක්, තීන්දුවක් හෝ ප්‍රදානයක්, නියමිත දින සිට, අධිකාරියට පක්ෂව හෝ එයට විරුද්ධව දෙන ලද තීන්දු ප්‍රකාශයක්, තීන්දුවක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත ඉවත් කිරීම.

3. 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අර්ථ නිරූපණය.

4. මේ පනතෙහි—

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය" යන්නෙන් 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අදහස් වේ; සහ

"මහවැලි සංවර්ධන මණ්ඩලය" යන්නෙන් 1976 අංක 3 දරන පනතින් සංශෝධිත 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ මහවැලි සංවර්ධන මණ්ඩලය අදහස් වේ.